# ගිණුම්කරණය

## අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සඳහා විෂයානුබද්ධ සංචිතය

### 05

### මූල්‍ය කළමනාකරණයේ පදනම විශ්ලේෂණය කරමින් ගිණුම්කරණ සංකල්පය භාවිතයට යොදා ගනියි - බහුවරණ සහ කෙටි ප්‍රශ්න

01. පහත අවස්ථාවලදී වඩාත්ම අදාළ වන ගිණුම්කරණ සංකල්පය කුමක්ද ?

(1) මූල්‍ය ප්‍රකාශනවල සෑම අගයක්ම මුදලින් ඉදිරිපත් කිරීම. - ..........................................
(2) මූල්‍ය ප්‍රකාශය සෑම වසරකදීම මිලියන වලින් වටයා දැක්වීම. - ..........................................
(3) වත්කමක වෙළඳ පොළ අගය වාර්තා නොකිරීම. - ..........................................
(4) දළ ලාභය ගණනය කිරීමේදී අවසාන තොගය ගැලපීම. - ..........................................

02. අඛණ්ඩ පැවැත්ම සංකල්පය ලෙස හැඳින්වෙන්නේ කුමක්ද ?

03. ණයගැති සහ ණයහිමි හඳුනා ගැනීමට මූලිකවම අදාළ වන ගිණුම්කරණ සංකල්ප නම්,

(1) අඛණ්ඩ පැවැත්ම
(2) උපචිත
(3) සංගතතාව
(4) කාලච්ඡේද
(5) ආරක්ෂණ

04. වත්කම් ක්ෂය කිරීමට අදාළ වන ගිණුම්කරණ සංකල්ප 03ක් ලියා දක්වන්න.

05. සී/ස ABC පොදු සමාගමේ ← (1)
2021/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලා/ලා හා වෙනත් විස්තර
ආදායම් ප්‍රකාශය
↑ (2)

| | (5) → | (රු,'000) |
|---|---|---|
| විකුණුම් ← (3) | | 100,000 |
| අඩු කළා - විකුණුම් පිරිවැය ← (4) | | 4,5000 |
| දළ ලාභය | | 55,000 |

ඉහත අංක මඟින් පෙන්වා ඇති කරුණු වලට අදාළ ගිණුම්කරණ සංකල්ප නම් කරන්න.

06. (1) ප්‍රාග්ධනය + වගකීම් = වත්කම් යන ගිණුම්කරණ සමීකරණය ගොඩනැගීමට ................................................ යන සංකල්පය අදාළ වේ.

(2) දළ ලාභය ගණනය කිරීමේදී අවසාන තොගය ගලපනු ලබන්නේ ...................................................... යන සංකල්පය අනුවය.

07. පහත සඳහන් ගිණුම්කරණ සංකල්ප සඳහා නිදසුනක් බැගින් දක්වන්න.

(1) යථාරූපී සංකල්පය
(2) ප්‍රමාණාත්මක සංකල්පය
(3) අඛණ්ඩ පැවැත්මේ සංකල්පය
(4) උපචිත සංකල්පය

08. වෙළඳ ලැබිය යුතු දෑ වෙනුවෙන් හානිකරන අලාභ සඳහා ඉඩහැරීමට අදාළ ගිණුම්කරණ සංකල්පය වන්නේ,

(1) අනුසීහුම් සංකල්පය
(2) අඛණ්ඩ පැවැත්ම සංකල්පය
(3) විචක්ෂණ සංකල්පය
(4) උපලබ්ධි සංකල්පය
(5) ඓතිහාසික පිරිවැය සංකල්පය

09. කල්බදු ක්‍රමයට ලබාගත් දේපල පිරියතක් මූල්‍ය ප්‍රකාශන වල පෙන්වීමට අදාළ ගිණුම්කරණ සංකල්පය වන්නේ,

(1) ගැලපුම් සංකල්පය
(2) යථාරූපී සංකල්පය
(3) අනාවරණ සංකල්පය
(4) කාලච්ඡේද සංකල්පය
(5) මූල්‍ය මිනුම් සංකල්පය

10. පහත සඳහන් ප්‍රකාශ වලින් නිවැරදි ප්‍රකාශ තෝරන්න.
a. විකුණුම්, විකුණුම් පිරිවැය සමඟ ගැලපීම ගැලපුම් සංකල්පයට අදාළ වේ.
b. ව්‍යාපාරය එහි අයිතිකරුවන්ගෙන් වෙන්වූ ස්වාධීන ආයතනයකි.
c. අපේක්ෂිත හානිකරන අලාභ සඳහා ඉඩ හැරීම ආරක්ෂණ සංකල්පයට අදාළ වේ.

(1) a , b
(2) a , b , c සියල්ලම
(3) b , c
(4) c පමණි
(5) a පමණි



වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව